# වේවැල් කර්මාන්තය හා බැඳුණු ජන ජීවිතය පිළිබඳ අධ්‍යයනයක් (ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න ග්‍රාමය ඇසුරිනි)

එම්.සී. නවෝදනී ජයවර්ධන*

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ දේශීය කර්මාන්ත අතර වේවැල් කර්මාන්තයට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න ගම්මානය අතීතයේ සිටම දෙස් විදෙස් සංචාරකයන් අතර වේවැල් භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රසිද්ධියක් උසුලයි. මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ වේවැල් භාණ්ඩ නිෂ්පාදනය ක්‍රියාවලිය හා වර්තමානයේ වේවැල් කර්මාන්තකරුවන් මුහුණ දෙන අභියෝග හා ඒ සඳහා ගත හැකි පියවර පිළිබඳව සාකච්ඡා කිරීම යි.

**හැඳින්වීම**

වේවැල් උපයෝගී කොට ගෙන නිවසට හා ගොවිතැනට අවශ්‍ය විවිධ උපයෝගිතා භාණ්ඩ නිපදවීම ඈත අතීතයේ සිටම පැවති කර්මාන්තයක් බවත් එකල ලංකාවේ වේවැල් බහුලව දක්නට ලැබුණු බැව් වේවැල්දූව, වේවැල්කඳුර, වේවැල්වල හා වේවැල්දෙණිය යන ග්‍රාමනාම වලින් හෙළිවන බවත් සිංහල විශ්වකෝෂය පෙන්වා දෙයි. (සිංහල විශ්වකෝෂය, 2001:286)

වේවැල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත අතර දිගු ඉතිහාසයකට උරුමකම් කියන කර්මාන්තයකි. මෙය කෙතරම් දුරට පැරණිවී ද යත් ඉතාම නොදියුණු ප්‍රමාණයේ ජීවත් වූ ආදි ජනයා පවා බඹර කැපීමේ දී අවශ්‍ය ඉනිමන් සකසා ගැනීමට වේවැල් භාවිතයට ගත් බවට සාක්ෂි තිබේ. තව ද සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ලක්දිවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවන අවස්ථාවේ ඒ සමඟ පැමිණි දහඅට කුලයට අයත් පිරිස අතර ''කුළු පොත්තන්'' නමින් හඳුන්වන ලද වේවැල් කර්මාන්තයෙහි නියැලෙන්නන් පිරිසක් සිට ඇති අතර ඔවුන් ලංකාවේ විවිධ ප්‍රදේශවල පදිංචි කරවා ඇත. (මහාවංශයඃසිංහල, 2003:81)

පැරණි සිංහල රජ සමයේ ජීවත් වූ වේවැල් කාර්මිකයන් වේවැල් උපයෝගී කරගෙන විවිධ නිර්මාණ සිදු කළ බව රොබට් නොක්ස් දක්වා ඇත

''බෙරවායින් ලඟට එන්නෝ කුළු පොත්තෝය. ඔවුන්ගේ කාරිය වේවැල්, බටපොතු ආදියෙන් කුළු, කුඩා වට්ටි, පෙට්ටි ආදිය විවීමයි. ඈඳ පුටු ද වියා දෙන ඔවුහු පඩි ද නොතකා ජීවිකාව රැක ගන්නෝය.''

මේ අනුව පෙනී යන්නේ වේවැල් කර්මාන්තය දිගු ඉතිහාසයකට හිමිකම් කියන්නක් බව ය.

---

* *තාවකාලික කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය,* chathurika.navodani@gmail.com

## රදාවඩුන්න ග්‍රාමයේ වේවැල් කර්මාන්තය

ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේවැල් කර්මාන්තය දිගු ඉතිහාසයකට හිමිකම් නොකීව ද එය පාරම්පරික කර්මාන්තයක් වශයෙන් මෑත ඉතිහාසයේ සිට පවත්වාගෙන එනු ලබන්නකි. නුවර-කොළඹ පාරේ පස්යාලේ රදාවඩුන්න නම් ගමේ වේවැල් කර්මාන්තය බහුලව දක්නට ලැබෙන බව සිංහල විශ්වකෝෂය දක්වා තිබේ. (සිංහල විශ්වකෝෂය, 2001:286)

මීරිගම ප්‍රදේශය තුළ මෙන්ම ශ්‍රී ලංකාව පුරාම වේවැල් කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නනේ රදාවඩුන්න ග්‍රාමයයි. නුවර අසිරිය නරඹන්නට යන දෙස් විදෙස් සංචාරකයන්ගේ නෙත්සිත් පැහැර ගන්නා නිර්මාණයන්ගෙන් සමන්විත කුඩා වේවැල් වෙළඳසැල් ප්‍රධාන මාර්ගය දෙපස වේවැල් කර්මාන්තය ආරම්භ වූ දා පටන් අද දක්වාම දැකගත හැකිය. හස්ත කරමාන්තයක් වශයෙන් වේවැල් කර්මාන්තය ද දේශීය දැනුම තුළින් සිදු කරනු ලබන්නකි. නිර්මාණශීලී හැකියාවත්, දෑතේ හුරුවත්, පාරම්පරික දැනුමත් ඔස්සේ වර්තමානයේ දී විවිධ වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබයි. ඒ නිසා වේවැල් කර්මාන්තයේ සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගේ විශාල වෙනසත් සිදුව තිබෙනු දැකගත නොහැකිය.

වේවැල් කර්මාන්තය වර්ෂ 1965 දී රදාවඩුන්න ගමේ ජීවත් වූ ධර්මදාස මහතා විසින් ආරම්භ කරන ලද්දක් ලෙස සැලකේ. ඒ වන විට මුළු ප්‍රදේශයටම තිබී ඇත්තේ වෙළෙඳසැල් දෙකක් පමණි. ඉන් එක් වෙළෙඳසැලක අයිතිකරු වී ඇත්තේ මුස්ලිම් ජාතිකයෙකි. ඔහු කුලියාපිටිය ප්‍රදේශයෙන් ගෙනවිත් විකුණන ලද විසිතුරු භාණ්ඩ දුටු ධර්මදාස මහතාට ද එම ශිල්පය ඉගෙන ගැනීමට කැමැත්තක් ඇති වුව ද ඔහුට එම ශිල්පය ලබා දීමට කිසිවකු කැමති වී නොමැත. 1976 දී පමණ කොළඹ දොන් කරෝලිස් සාප්පුවේ විකිණීමට දමා තිබූ ගෘහ භාණ්ඩ දැකබලා ගෙනවිත් ස්වෝත්සාහයෙන් පුටු විවීම ඇරඹූ ධර්මදාස මහතා පසුව රදාවඩුන්න ගම්වාසීන් මෙම කර්මාන්තයට යොමු කර ගැනීමට සමත් විය. මෙසේ ධර්මදාස මහතා විසින් ගම්මානය පුරා ව්‍යාප්ත කරනු ලැබූ වේවැල් භාණ්ඩ අද දක්වාම පාරම්පරික කර්මාන්තයක් ලෙස ලංකාව පුරාම ප්‍රසිද්ධ වී ඇත.

මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රදාවඩුන්න හා ඒ අවට ප්‍රදේශවල අතීතයේ වේවැල් නිෂ්පාදනය කළ පවුල් සංඛ්‍යාව 1493 ක් වුව ද අද වන විට එම ප්‍රමාණය පවුල් 493 දක්වා අඩු වී ඇත.

වේවැල් කර්මාන්තයේ ප්‍රධාන අමුද්‍රව්‍ය වේවැල් ය. අතීතයේ ගම අභ්‍යන්තරයට වන්නට හැතැප්ම දහයක් පහළොවක් ගමන් කළවිට වේවැල් අවශ්‍ය තරම් කපා ගෙනැවිත් ඇත. රදාවඩුන්න ආසන්නයේ ඇති වේවැල්දෙණිය ග්‍රාමයේත් ඒ අවට කැළෑ ප්‍රදේශවලත් වේවැල් බහුලව පැවති බව ගම්වැසියෝ ප්‍රකාශ කරති. එහෙත් වර්තමානයේ දී ප්‍රදේශයේ කිසිදු ස්ථානයකින් වේවැල් සොයා ගත නොහැක. එනිසා අම්පාර, මනම්පිටිය, බිබිල වැනි ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් වේවැල් ගෙන්වා ගැනීම සිදු කරයි. විවිධ වේවැල් වර්ග නිෂ්පාදන සඳහා උපයෝගී කර ගනී. ඒවා නම්,

- සුදු වේවැල්
- කම්බොටු වේවැල්
- හීන් වේවැල්
- මා වේවැල්
- පොළොන්නරු වේවැල්
- නර වේවැල්
- තුඩරැල්
- එළ වේවැල්
- කැකුළු වැල්
- කෝර වැල් (මැලේසියා වැල්)
- ගෙඩි වැල් ආදියයි.

එහෙත් මෙම වේවැල් ප්‍රමාණවත් තරම් ලංකාවේ නොමැති නිසා විදෙස් රටවලින් ආනයනය කිරීමට සිදුව ඇත. හීන් වේවැල් හා මා වේවැල් අතීතයේ බහුලව භාවිත කළ ද ආනයනය කරන මැලේසියා වේවැල් වර්තමානයේ බහුල වශයෙන්ම භාවිත කරනුයේ ඒවා විවීම සඳහා වඩාත් පහසු නිසාය. එපමණක් නොව අද වන විට වේවැල් ප්‍රවාහනය සඳහා ද බලපත්‍ර ලබා ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බවත් ඇතැම් අවස්ථාවලදී බලපත්‍ර නොමැතිව පවා වේවැල් ගෙන ඒම සිදු කරන බවත් කර්මාන්තයෙහි නියැලෙන්නන් පවසති. වර්තමානයේ විශාල අමුද්‍රව්‍ය හිඟයක් පවතින නිසා ගෙන්වන අමුද්‍රව්‍ය ද ඉහළ මිලකට ලබා ගැනීමට සිදු වීමෙන් නිෂ්පාදන භාණ්ඩවල මිල ද ඉහළ දැමීමට සිදුව ඇති බව වේවැල් කාර්මිකයෝ පවසති.

අමුවෙන් කපා ගෙන එනු ලබන වේවැල් ජලයේ සෑදෙන නිසා ඒවායේ පවතින ජලය ඉවත් කිරීම පළමුව සිදු කළ යුතු වේ. ඒ සඳහා අමු වේවැල් කෙලින් කර තබනු ලබයි. මෙසේ ජලය ඉවත් නොකළහොත් වේවැල් අවශ්‍ය පරිදි නවා ගැනීම කළ නොහැකි වේ. සතියක පමණ කාලයක් එසේ තබා පොලොවේ තිරස් අතට දැමීම සිදු කරයි.

හොඳින් ජලය ඉවත් වූ පසු වේවැල් නවා ගනු ලබයි. වේවැල් කැබැල්ලක් ගෙන එය භූමිතෙල් භාජනයකට දමා පොගවා පන්දමක් සාදාගෙන එම දැල්ලෙන් වේවැල් නැමීම පැරණිතම ක්‍රමය වේ. අනතුරුව භූමිතෙල් දමා හුළං ගැසූ "බෝ ලැම්ප්" නම් ලාම්පුවට වේවැල් අල්ලා රත් කරමින් වේවැල් නැවීම සිදු කර තිබේ. එය තවදුරටත් වර්ධනය වී පසු කාලීනව "ගෑස් ටෝච්" නම් උපකරණය භාවිතයට පැමිණ ඇත. වේවැල් නැවීමේ දී අච්චු කඳ ද වේවැල් හීනියට ඉරා ගැනීම සඳහාත් මැදීම සඳහාත් අච්චු තලය ද උපයෝගී කර ගනී. මෙලෙස නවා ගත් වේවැල් කොටස් එකට සම්බන්ධ කිරීම සිදු කරනුයේ ලී ඇණ හා යකඩ ඇණ උපයෝගී කරගෙන ය. අනතුරුව සිය පාරම්පරික දැනුම ඔස්සේ වේවැල් විවීම සිදු කරනු ලබයි.

එලෙස වේවැල් කර්මාන්තකරුවන් විසින් සකස් කරන වේවැල් නිෂ්පාදන රාශියකි. වට්ටි, පෙට්ටි, ඉඳි ආප්ප තට්ටු, කිරි ගොටු, පුටු (කොහිල් පුටු, ඔබරෝයි පුටු, මොනර පුටු, පිඹුරා පුටු හෝ රොකින් පුටු, ඇඳි පුටු, සමනල පුටු, වැට පුටු, දැල් පුටු, හාන්සි පුටු), අල්මාරි,

කබඩ්, ඇඳන්, වේවැල් කුඩ, සහ වෙනත් විසිතුරු භාණ්ඩ රාශියක් නිෂ්පාදනය කිරීමට මොවුන් සතුව සුවිශේෂී හැකියාවක් පවතී.

වේවැල් භාණ්ඩ නිර්මාණය කිරීමේ දී ඒවායේ ආකර්ෂණීයභාවය උදෙසා,

- කිරිබත් කැට රටාව
- තෙත්තු රටාව
- ගස්ලබු රටාව
- මුද්ද රටාව
- දැල් රටාව
- පිඹුර රටාව
- කොයිල් රටාව වැනි විවිධ රටාවන් භාවිත කරනු දැකගත හැකිය.

මුල් කාලීන වේවැල් ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහිලා වැඩි අවධානයක් යොමුව පැවති නමුත් අද වන විට විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය බහුලව සිදු කරනු ලබයි. වේවැල් ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද පහන් ආවරණ සඳහා වර්තමානයේ සංචාරක හෝටල්වලින් හොඳ ඉල්ලුමක් පවතින බව විසිතුරු භාණ්ඩ නිර්මාණයේ යෙදී සිටින තරුණ වේවැල් නිෂ්පාදකයන් ප්‍රකාශ කරති. වේවැල් වලින් සැකසූ විවිධ සත්ව රූප (අලි, කොටි, සිංහයන්, තාරාවන්, හරකුන් වැනි සතුන්) සඳහා හොඳ ඉල්ලුමක් පැවතිය ද එවැනි නව නිර්මාණ කෙරෙහි යොමුවන වේවැල් නිර්මාණකරුවන් ප්‍රදේශයටම සිටිනුයේ ඉතා සීමිත පිරිසක් පමණි. එසේ වුවද වර්තමානයේ සෑම නිෂ්පාදකයෙකුම පාහේ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් දැක ගත හැකිය.

පාරම්පරික දැනුම මගින් සිදු කරන වේවැල් භාණ්ඩයන්හි දේශීයත්වය පිළිබිඹුවන නිර්මාණ වර්තමානයේදීත් නිර්මාණය වනු දැක ගත හැකිය. කොහිල් පුටු, ඔබරෝයි පුටු, මොනර පුටු, පිඹුරා පුටු වැනි නිර්මාණ අතීතයේ බොහෝ සෙයින් නිර්මාණය වුවද වර්තමානයේ මේ නිර්මාණ විශාල වශයෙන් නිර්මාණය නොවේ. එහෙත් වර්තමානයේ සිදු කරන නිර්මාණයන්හි අතීතයේ භාවිත කළ කිරිබත් කැට රටාව, තෙත්තු රටාව, ගස්ලබු රටාව, මුද්ද රටාව වැනි රටාවන් භාවිතය දැකගත හැකිය.

වේවැල් කල් තබා ගැනීම සඳහා අතීතයේ මෙන්ම කපුරු බෝල කුඩු කර භූමිතෙල්වල මිශ්‍ර කර එම මිශ්‍රණය වේවැල්වල ආලේප කිරීම සිදු කරන අතරම විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතයට ද යොමු වී ඇත.

මෙලෙස නිෂ්පාදනය කරන භාණ්ඩ අලෙවි කිරීම ද වර්තමානයේ දුෂ්කර කාර්යයක් වී ඇත. කොළඹ-නුවර ප්‍රධාන මාර්ගය දෙපස අලෙවිසල් පවත්වාගෙන යාම සිදුකරයි. මීට අමතරව වේවැල් පුටු ආදිය නිවෙසින් නිවෙසට ගොස් අලෙවි කිරීම ද ඇතැමුන් විසින් සිදු කරනු ලබයි. මේ නිසා වටිනාකමින් වැඩි වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කරනුයේ ඒ සඳහා ඇණවුමක් ලැබුණහොත් පමණි.

මේ තත්වය මත වර්තමානය වන විට වේවැල් කර්මාන්තය ඉතාමත් වේගයෙන් අභාවයට යමින් පවතී. වැඩිහිටි වේවැල් නිෂ්පාදකයින් හැරුණුවිට මෙම කර්මාන්තය වෙත යොමු වී සිටින තරුණ පිරිස අතළොස්සකි. තවත් පරම්පරා දෙක තුනක් යාමට මත්තෙන් රදාවඩුන්න ප්‍රදේශයෙන් සම්පූර්ණයෙන්ම වේවැල් කර්මාන්තය තුරන්ව යා හැකි බව වැඩිහිටි වේවැල් නිෂ්පාදකයෝ ප්‍රකාශ කරති. මේ සඳහා අමුද්‍රව්‍ය හිඟයත්, අමුද්‍රව්‍ය අධික මිලකින් යුක්ත වීමත් ප්‍රමුඛව බලපායි. එසේම ශ්‍රමික හිඟය ද වර්තමානයේ දැක ගත හැකිය. පුටුවක් විවීමේ දී ශ්‍රමිකයාට කුලිය වශයෙන් රු.350/=ක් පමණ ලැබෙන අතර එය දෛනිකව ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නොවේ. ශ්‍රමයට සරිලන නිසි වැටුපක් නොලැබීම සහ බහුල වශයෙන් ඇඟලුම් කර්මාන්ත ආදියෙහි සීඝ්‍ර ව්‍යාප්තිය නිසාවෙන් බහුතරයක් තරුණ පිරිස් එවැනි ස්ථාන කරා යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රමික හිඟය උද්ගතව ඇත.

අතීතයේදී රදාවඩුන්න ග්‍රාමයට අයත් ග්‍රාම නිළධාරී වසම් 05ක් පුරාවට පුළුල් වශයෙන් වේවැල් කර්මාන්තය ව්‍යාප්තව පැවතුණු අතර එකල ගමෙහි ජීවත් වූ පිරිසගෙන් බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ වේවැල් කර්මාන්තය යි. දෙස් විදෙස් වශයෙන් ඉමහත් කීර්තියට පත් දීප්තිමත් ඉතිහාසයකට උරුමකම් කියූ වේවැල් කර්මාන්තය වර්තමානයේ දී පත්ව ඇත්තේ ඉතා ශෝචනීය තත්වයකට ය. මේ වනවිට අභාවයට යාමේ තර්ජනයට ලක්ව ඇති මෙකී කර්මාන්තය රදාවඩුන්න ගමෙහි කොළඹ-නුවර ප්‍රධාන මාර්ගය දෙපස ජීවත්වන සීමිත පිරිසකට පමණක් ව්‍යාප්තව ඇත.

මෙම තත්ත්වය මත වේවැල් කර්මාන්තකරුවන් නඟා සිටුවීමට හා ඒ සම්බන්ධ දැනුම ආරක්ෂා කිරීම සඳහා සමාජයේ අවධානය යොමු විය යුතුය.

අමුද්‍රව්‍ය අවම මිලට සපයා ගැනීම සඳහා රජයේ සහාය ලබා ගත යුතුය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සමිතිය හරහා වේවැල් ලබා ගැනීමට අවශ්‍ය බලපත්‍රයක් ලබා දිය යුතුය. දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පවත්නා හස්ත කර්මාන්ත සමිති හරහා බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

එසේම වර්තමාන තරඟකාරී ජීවන රටාවට සරිලන වැටුපක් ලබා දීම තුළින් දේශීය කර්මාන්තකරුවන් දිරි ගැන්වීම කළ යුතුය. ශ්‍රමිකයා තෘප්තිමත් වීම තුළින් කාර්යක්ෂමතාවය වැඩි වේ. ඒ නිසා ආකර්ශණීය වැටුප්, දිරි දීමනා, ප්‍රවාහන පහසුකම්, රක්ෂණ ක්‍රම හා අර්ථසාධක වැනි සුබසාධන ශ්‍රමිකයින්ට ලබා දීමට කටයුතු කිරීම තුළින් හස්ත කර්මාන්ත නගා සිටුවිය හැකි ය. එමෙන්ම සමිති හරහා ණය ආධාර ලබා දීම සිදු කළ යුතුය.

අලෙවිය සඳහා මනා වෙළඳපලක් ඇතිකර දෙස් විදෙස් සංචාරකයින්ගේ අවධානය මෙම දේශීය හස්ත කර්මාන්තය කෙරෙහි යොමු කරවීමට පියවර ගත යුතුය. විදේශ වෙළඳපල වෙත පිවිසීමට ඉඩ ලබා දීම, සංචාරක මණ්ඩලයට අයත් වෙළඳසැල්වලට හෝ විශේෂ ආර්ථික මධ්‍යස්ථානවල හෝ රටෙහි ප්‍රධාන නගරවල අලෙවි ප්‍රදර්ශනාගාර ඇති කිරීමට ක්‍රියා කළ යුතුය.

රදාවඩුන්න ප්‍රදේශය "කර්මාන්ත ගම්මාන" ලෙස නම් කර තිබුණ ද හස්ත කර්මාන්ත නගා සිටුවීමට රාජ්‍ය අංශයේ නිසි ක්‍රමවේදයක් නොපවතී. මේ නිසා මෙම සංකල්පය ඇති කළ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ හා සාම්ප්‍රදායික කර්මාන්ත අමාත්‍යාංශයේ බලධාරීන්ගේ අවධානය මේ කෙරෙහි යොමු කළ යුතුය. එසේම රැකගත යුතු දේශීය කර්මාන්තයක් වශයෙන් වේවැල් කර්මාන්තය ආශ්‍රිතව පවත්නා දේශීය දැනුම සංරක්ෂණය කිරීමට පියවර ගත යුතු ය.

දේශීය නිෂ්පාදන සඳහා නිසි වටිනාකමක් නොලැබීමට ප්‍රධාන හේතුවක් වන්නේ දේශීය නිෂ්පාදන රට තුළ පැවතිය ද ඒවා නොතකා විවිධ ආදේශක භාණ්ඩ ආනයනය කිරීම යි. මේ නිසා හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම වැලකීමෙන් කර්මාන්ත නගා සිටුවීමට හැකිවනු ඇත.

එනිසා අභාවයට යමින් පවත්නා ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න ග්‍රාමයේ වේවැල් කර්මාන්තය තව දුරටත් ආරක්ෂා කර ගැනීම කෙරෙහි වගකිව යුත්තන්ගේ අවධානය යොමු කිරීම වර්තමානයේ අත්‍යවශ්‍යම කරුණක් බවට පත් වී ඇත.

**සමාලෝචනය**

දේශීය හස්ත කර්මාන්තයක් වශයෙන් වේවැල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ දේශීය අනන්‍යතාවය පිළිඹිබු කරන සංකේතයක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම කර්මාන්තය වර්තමානය වන විට සීමිත පිරිසකට පමණක් සීමා වී ඇති අතර ආදේශක භාණ්ඩ භාවිතයට ජනතාව හුරු පුරුදු වීම හේතුවෙන් වේවැල් නිෂ්පාදනය අලෙවිය අවම වීම ඊට හේතු වී තිබේ. මේ තත්ත්වය මත වර්තමානයේ වේවැල් කර්මාන්තයේ නිරත වේවැල් කාර්මිකයන් මෙම දේශීය හස්ත කර්මාන්තය අභාවයට යාමට නොදී තවදුරටත් රැකගෙන ඉදිරියටත් පවත්වා ගෙන යාමට දැඩි වෙහෙසක් ගැනීම අගය කළ යුතුම ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

සිංහල විශ්ව කෝෂය, 10 කාණ්ඩය (2001), සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.

නොක්ස්, රොබට් (2011), එදා හෙළදිව, කරුණාරත්න, ඩේවිඩ් (අනු.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

බණ්ඩාර, ඉනෝකා (2012), "රදාවඩුන්නේ වේවැල් : දරාගන්න බැරි තරම් බැටකෑවත් වේවැල් බඩු අප හදන්නේ පුරුද්දට", *සිළුමිණ*, දෙසැ. 9.